# සූත්‍ර පිටකයේ අන්තර්ගත විනය පිටකයේ මූලබීජ පිළිබඳ විමර්ශනයක්

**පනාමුරේ චන්දිම හිමි**

**ප්‍රවේශය**

බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය ත්‍රිපිටකය යනුවෙන් හඳුන්වයි. එනම් සූත්‍ර, විනය, අභිධර්මය යි. මෙයින් කුමන පිටකයක් ප්‍රථමයෙන් ඇති වූයේද යන්න පිළිබඳ විවිධ මතවාද ඇත. ත්‍රිපිටකයට අයත් ඉපැරණිම කොටස සූත්‍රපිටකය බව පවසන පඬිවරුන් ප්‍රකාශ කරන්නේ පශ්චාත් කාලීනව ඇති වූ අභිධර්ම පිටකය හා විනය පිටකය පිළිබඳ තොරතුරු එහි ඇතුළත්ව තිබේය යන්නයි.

මෙහි දී අප බලාපොරොත්තු වන්නේ සූත්‍රපිටකයේ අන්තර්ගත විනය පිටකාගත කරුණු විමර්ශනය කිරීමයි. ප්‍රථමයෙන් ''විනය'' යනු කුමක්ද යන්න පැහැදිලි කරගත යුතුය. ඉතිවුත්තක පාලි අට්ඨකතාව සඳහන් කරන ආකාරයට විනය යනු ''විසිට්ඨං වා නයතීති විනයො'' **(ඉතිවුත්තක පාලි අට්ඨකතා, 01).**

ඒ අනුව විශිෂ්ට භාවයට පත්වීමට උපකාර වන්නේ විනයයි. පටිසම්භිදා මග්ග විනය අට්ඨකතාව සඳහන් කරන්නේ ''විශේෂ වූ පිරිසිදු බවට පමුණුවන හෙයින් විනය නම් වන බවයි.'' ''විසුද්ධං නයතීති විනයො'' **(පටිසම්භිදා මග්ග අට්ඨකතා, 06).**

යනුවෙන් ඒ බව දක්වා ඇත. පොදුවේ විනය නමින් පිළිගනු ලබන්නේ කාය වාග් සංවරයයි. ක්ලේශයන් ප්‍රහාණය පිණිස උත්සාහවත් වීම මේ නමින් හඳුන්වා ඇත. සභ්‍ය වූ ආචාර විධීන් විනය නමින් හඳුන්වන බවද පැවසෙයි.

විනය සම්බන්ධයෙන් ඉදිරිපත් කොට ඇති ශබ්දකෝෂ අර්ථයන් ද මෙහිදී සැලකිය යුතුය. ඒ අනුව පොල්වත්තේ බුද්ධදත්ත හිමි තම **පාලි සිංහල අකාරාදියෙහි** දී ''විනය'' යන පදයට අර්ථ පහක් දක්වයි. එනම්,

හික්මීම, විනාශ කිරීම, යටපත් කිරීම, භික්ෂූන්ට අයත් ශික්ෂා කොටස, ඒ ශික්ෂාවන් ඇතුළත් දහම් කොටස වශයෙනි. **(බුද්ධ දත්ත හිමි. පොල්වත්තේ, 1998, 451).**

එංගලන්තයේ පාලි පොත් සමාගම **(PTS)** විසින් සම්පාදනය කර ඇති **පාලි ඉංග්‍රීසි ශබ්දකෝෂයේදී** විනය යන පදයට අර්ථ හයක් දක්වා ඇත.

ඉවත් කිරීම (Driving out)

නිෂ්ප්‍රභ කිරීම (Abolishing)

විනාශය (Destruction)

අස් කිරීම (Removal)

අවබෝධය සඳහා වූ මාර්ගය (Way of saying or Judging sense terminology)

හැසිරීම, ආචාර ධර්ම (Norm of conduct morality good behavior) **(Davids Rhys, 1978, 623)** වශයෙනි.

මීට අමතරව R. C. Childers විසින් සම්පාදිත **පාලි ශබ්දකෝෂයේදී** දක්වා ඇති අර්ථය මෙසේය.

ඉවත් කිරීම (Putting Away)

වැළකීම (Aboidence)

අභිභවනය කිරීම (Subduing)

පරිවර්තනය කිරීම (Conversion)

පුහුණුව (Training)

ශික්ෂණය (Discipline) (**trubuer childers r. c.340p**)

''විනය'' යන වදන විග්‍රහ කිරීමෙන් පැහැදිලි වන්නේ විනය යනු ඉගෙනගත යුත්තක් නොව පිළිපැදිය යුත්තක් බවයි. එය දේශනා කළ යුත්තක් නොව ආදර්ශයට නැංවිය යුත්තක් බවයි. මුල්කාලීනව භික්ෂූන් වහන්සේලා හික්මවීම සඳහා බුදුන් වහන්සේ දේශනා කරන ලද්දේ ශික්ෂා පද නොව ධර්මයයි. ඒ බව ''අහං හි බ්‍රාහ්මණ විනයාය ධම්මං දෙසෙමි. රාගස්ස දොසස්ස මොහස්ස අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං විනයාය ධම්මං දෙසෙමි'' **(පරාජිකා පාලි, 2006,3).**

මේ අනුව බුද්ධත්වයෙන් මුල් විසි වසක කාලය තුළ විනය නමින් අදහස් කරන ලද්දේ අකුසල ධර්ම ප්‍රහාණයයි. රාග, දෝස, මෝහ යන ත්‍රිවිධ ධර්මයන්ගේ ප්‍රහාණයයි.

විනය, ගිහි විනය සහ පැවිදි විනය වශයෙන් දෙයාකාර වේ. ගිහි විනයට අදාළ දේශනා බොහෝමයක් ඇතුළත් වන්නේ සූත්‍ර පිටකයේය. ගිහි විනය නමින් හඳුන්වන සූත්‍ර ද එහි ඇතුළත් වී ඇත. පැවිදි විනයට අදාළ කරුණු බොහෝමයක් විනය පිටකයේ ඇතුළත් වී තිබේ. මෙහිදී අපේක්ෂා කරන්නේ සූත්‍ර පිටකයේ අන්තර්ගත විනය පිටකයේ මූලික සංකල්ප ගවේෂණය කිරීමයි.

අන්තර්ගතය

භික්ෂු සාසනය ආරම්භ වන්නේ පස්වග මහණුන් හා යසකුල පුත්‍රයාත් ඔහුගේ මිතුරන්ගෙනුත් බව **මහාවග්ග පාලියේ** සඳහන් වෙයි. මුල්කාලීන භික්ෂූන් වහන්සේලා සීලමය ශික්ෂාවලින් සංවර භාවයට පත් වූහ. මුල්කාලීනව ශාසනයට ඇතුළත් වූ අය ආධ්‍යාත්මික පාරිශුද්ධියෙන් යුක්ත පිරිසක් වූ නිසා ශික්ෂාපද පැනවීමේ අවශ්‍යතාවයක් නොවීය.

''සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාණ සච්චි කරණත්තාය. ඉමං කාසාවං ගහෙත්වා පබ්බාජේථ'' **(පාරාජික පාලි භික්ෂු ප්‍රාතිමෝක්ෂය, 2006,25).**

ගිහි සමාජයේ පරමාර්ථයට වෙනස්ව ආත්ම විමුක්තිය පිණිස ගිහිගෙය ධනධාන්‍ය ඥාති හිතමිතුරන් සමගින් අතහැර සම්බුද්ධ ශාසනයේ පැවිදි වූහ. කසාවත් හැඳ පිණ්ඩාහාරයෙන් ජීවත් වීම

මුල් කාලීන භික්ෂු සමාජයේ මූලික ලක්ෂණය විය. සංඝ සංවිධානය ආරම්භයේ විනය හෝ ප්‍රාතිමෝක්ෂ ශික්ෂා පද නොවූ බව ප්‍රසිද්ධ කරුණකි. එම නිසා සූත්‍ර පිටකයේම විනය නීති රීති අන්තර්ගත විය. **දීඝනිකායේ** බ්‍රහ්මජාල සූත්‍රයේ සීලය කොටස් තුනකට බෙදා දක්වා ඇත. එනම් චුල්ල සීල, මධ්‍යම සීල, මහාසීල යනුවෙනි.

**චුල්ල සීල** - ප්‍රාණඝාතයෙන් වැළකීම

බීජගාම භූතගාම ශික්ෂාපද

හොරකමින් වැළකීම

සන්නිධිකාරක වැළඳීම

මෛථුන සේවනයෙන් වැළකීම

නැටුම් බැලීම

කේලමෙන් වැළකීම

සුදු ක්‍රීඩාව

පරුෂ වචනයෙන් වැළකීම

**(දීඝ නිකාය, බ්‍රහ්මජාල සූත්‍රය, 2006, 110-112)**

**මධ්‍යම සීල** - උසසුන් මහසුන් දැරීම

හිස් වචනයෙන් වැළකීම

ශරීර මණ්ඩනයේ ඇලීම

තිරිසන් කතාවේ ඇලීම

මිත්‍යා ආජීව ක්‍රමවලින් වැළකීම

විග්ගහ විවාද කතා නොකිරීම

පණිවිඩ අණපණත් ගෙන යෑම

කුහකවීම ආදි වැරදිවලින් වැළකීම **(එම)**

**මහා සීල -** නිමිති කීම

සාමුද්‍රිකා ශාස්ත්‍ර කීම

නැකැත් කීම

ග්‍රහ තාරකා පිළිබඳ ශාස්ත්‍ර කීම

කාලගුණය හා මුද්‍රා ගණන් දැන කීම

වෙද හෙදකම් කිරීම

බලිබිලි පූජා පැවැත්වීම ආදියෙන් වැළකීම **(එම)**

ප්‍රාණඝාතයෙන් වැළකීම යනුවෙන් චුල්ල සීල යටතේ දක්වා ඇත්තේ ප්‍රාණයට හිංසා කිරීමෙන් සම්පූර්ණයෙන් වැළකිය යුතුය යන්නයි. පවට බියෙන් හා ලැජ්ජාවෙන් දයාවෙන් යුක්තව වාසය කළ යුතුය. සියලු සත්වයන් කෙරෙහි අනුකම්පාවෙන් වාසය කළ යුතුය යන්න තථාගතයන් වහන්සේගේ උපදේශයයි.

බීජගාම භූතගාම ශික්ෂාපදවලින් දක්වා ඇත්තේ භික්ෂූන් විසින් තෘණ ගස්වැල් ආදීන්ගේ භේදනයෙන් වැළකිය යුතු බවයි. නුදුන්දේ ගැනීමෙන් වැළකීම දුන් දෙයම ගන්නා ස්වභාවයෙන් යුක්ත විය යුතුය. දුන් දෙය ගැනම කැමති විය යුතුය. වංචා රහිතව පිරිසිදු සිතින් වාසය කළ යුතුය. කාම සේවනයෙන් වැළකී දුරාචාර යැයි සැලකෙන කාම සම්පත්තියෙන් ඈත් විය යුතුය. ස්ත්‍රීන් සරණ පාවා ගැනීම වැනි භික්ෂුවකට නොගැළපෙන දෙයින් වැළකිය යුතුය. බොරු කීමෙන් වැළකී සත්‍යයම ප්‍රකාශ කළ යුතුය. ස්ථිර වූ ඇදහිය හැකි කතාවෙන් යුක්ත විය යුතුය. ලෝකයා මුළාවට පත් කරන විෂම වූ වාද විවාද නොකළ යුතුය. විවිධ හේතු සාධක පදනම් කරගෙන බෙදී සිටින අය එක් කළ යුතුය. සමඟියෙන් සිටීමට අනුබල දිය යුතුය. සමගි වචන කතාකරමින් ක්‍රියා කළ යුතුය.

පරුෂ වචනයෙන් වැළකිය යුතුය. නිර්දෝෂී කර්ණ රසායන වචනම භාවිත කළ යුතුය. නිසරු හිස් වචනයෙන් තොර විය යුතුය. යමක් පවසන්නේ නම් කිව යුතු කාලය බලා කිව යුතුය. කේලාම් කීමෙන් වැළකිය යුතුය. පරම සත්‍යයම ප්‍රකාශ කළ යුතුය. චුල්ල සීල යටතේ මෙම කරුණු විග්‍රහකර ඇත.

මධ්‍යම ශීල යනුවෙන් පැහැදිලි කර ඇත්තේ ශ්‍රද්ධාවෙන් සම්බුද්ධ ශාසනයේ පැවිදි වූ පිරිස් විසින් උස් අසුන් මහා අසුන් දැරීමෙන් වැළකිය යුතුය. විවිධාකාර ආලේපන ආදියෙන් ශරීර අලංකරණය නොකළ යුතුය. සුවඳ ද්‍රව්‍ය තබාගෙන පරිහරණය නොකළ යුතුය. නැටීම ගී කීම වීණා ආදිය වැයීම රඟ මඬුලු ආදිය බැලීම ගොතා රසකරමින් කියන බොරුකතා ඇසීම කංස තාලම් හෝ අත් තාලම් වැයීම හෝ මළමිණි නැංවීම ආදී විජ්ජාවලින් වැළකී සිටීම ආදිය මධ්‍යම ශීල ගණයට ඇතුළත් වෙයි.

මහා ශීල යනුවෙන් දක්වා තිබෙන්නේ ළාමක විද්‍යාවන් කෙරෙහි නො ඇලී වාසය කළ යුතුය යන්නයි. ශරීර අවයව බලා ශාස්ත්‍ර කීම, නිමිති කීම, අබ ආදිය කටේ දමා මන්ත්‍ර කියා ගින්නට පිඹීම අත්ල හෝ ඇඟිලි පුරුක් බලා නිමිති කීම, බලිබිලි පූජා ආදි යාග පැවැත්වීම, මෙන්ම ග්‍රහ තාරකාවන්ගේ ග්‍රහණය පිළිබඳ හෝ ජ්‍යොතිෂ්‍ය ශාස්ත්‍රය පිළිබඳ අනාවැකි කීම භික්ෂුවක විසින් නොකළ යුතුය. **දීඝ නිකායේ** බ්‍රහ්මජාල සූත්‍රයේ සඳහන් වන මෙම තොරතුරු විනය පිටකාගත සංකල්ප බව පැහැදිලිය.

විනය පිටකයේ මූල බීජ අන්තර්ගත තවත් සූත්‍රයක් ලෙස සුත්ත නිපාතයේ කිංසීල සූත්‍රය හැඳින්විය හැකිය. එහිදී සීලය පිළිබඳ මෙසේ දක්වා ඇත.

වුඩ්ඪාපචායි අනුසූයකොසියා

කාලඤ්ඤු චස්ස ගරූනං

ධම්මිකථං එරයිතං ඛණඤ්ඤු සුණෙයා

සක්කච්ච සුභාසිතානි **(ඛුද්දක නිකාය II, 2006, 97).**

වැඩිහිටියන්ට සැලකීම, ඊර්ෂ්‍යා නොකිරීම, කාම සිතුවිලි නොඉපදවීම, ගුරුවරයාට සවන්දීම, අනුන් නොරැවටීම එකට එක නොකිරීම, සුළු දෙයකට පවා කලබල නොවීම ආදි වූ ආචාර ධර්ම පද්ධතියක් එහි ඇතුළත් වී ඇත. මෙයද විනය පිටකයේ මූලික අවස්ථාව ලෙස ද සැලකිය හැකිය.

**මජ්ඣිම නිකායේ** එන සාමගාම සූත්‍රයද විනය පිටකයේ මූලික කරුණු ඉදිරිපත් කරයි. නිගණ්ඨනාථ පුත්ත ශාස්තෘවරයා කලුරිය කොට නොබෝ දිනකින් එම ශ්‍රාවකයන් අතර ඇති වූ ගැටලුකාරී තත්ත්වය හේතුකොටගෙන මෙම දේශනාව සිදුකර ඇත.

"චත්තාරි මානි ආනන්ද අධිකරණානි. කතමානි චත්තාරී විවාදාධිකරණං අනුවාදාධිකරණං ආපත්තාධිකරණං කිච්චාධිකරණං ඉමානි බො ආනන්ද චත්තාරි අධිකරණානං." (**මජ්ඣිම නිකාය III, 2006, 56).**

මේ අනුව අධිකරණ සතරක් වන බවත් ඒවා විවාදාධිකරණ, අනුවාදාධිකරණ, ආපත්ති අධිකරණ කිච්චාධිකරණ වන බවත් දක්වා ඇත. මීට අමතරව සප්ත අධිකරණයන්ම මෙම සූත්‍රයේදී විග්‍රහ කර ඇත.

මෙම කරුණුම ඇතුළත් සූත්‍රයක් **අංගුත්තර නිකායේ** අධිකරණ වග්ගයේ දැකිය හැකිය. එහි එන ආකාරයට

''යස්මිං භික්ඛවෙ අධිකරණෙ ආපන්නොච භික්ඛු චෝදතොච භික්ඛු න සාධුකං අත්තනාව අත්තානං පච්චවෙක්ඛති'' (**අංගුත්තර නිකාය I, 2006, 109).**

**අංගුත්තර නිකායේ** සත්තක නිපාතයේ විනය වග්ගය සූත්‍ර පිටකයේ අන්තර්ගත විනය සංකල්පවලට කදිම නිදසුනකි. විනයධර වීමට අවශ්‍ය කරන කරුණු හතක් සීලවග්ග විනයධර සූත්‍රයේ ඇතුළත් වෙයි.

''සත්තහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු විනයධරො හෝති. කතමෙ සත්තහි ආපත්තිංජානාති ලහුකං ආපත්තිං ජානාති. ගරුකං ආපත්තිං ජානාති සීලවා හොති. පාතිමොක්ඛ සංවර සංවුතො විහරති. ආචාරගෝචර සම්පන්නො අණුමත්තෙසු වජ්ජේසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨ ධම්ම සුඛ විහාරානං නිකාමලාභි හොති. අකිච්ඡලාභි අකසිරලාභි, ආසවානං ඛයා අනාසවං චෙතො විමුක්තිං පඤ්ඤා විමුක්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. ඉමෙ බො

භික්ඛවෙ සත්තහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු විනය ධරො හොතීති'' **(අංගුත්තර නිකාය I, 2006, 345).**

මහණෙනි ධර්ම සතකින් යුක්ත භික්ෂුව විනයධර වේ. කවර සතක්ද යත්

1. ස්වල්ප වූ ඇවැත් දනියි.
2. ඇවැත් නොවන දේ දනියි.
3. මහා ඇවැත් දැන ගනියි.
4. ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් සංවර වෙයි.
5. ආචාරයෙන් හා ගෝචරයෙන් යුක්ත වූයේ ස්වල්ප වරදෙහි බිය දකියි.
6. මෙලොව සැප විහරණ ඇති සතර ධ්‍යානයන් ලබයි.
7. චිත්ත විමුක්තිය ද ප්‍රඥා විමුක්තිය ද ප්‍රත්‍යක්ෂ කොට වාසය කරයි.

මේ අනුව පැහැදිලි වන්නේ විනයධර භික්ෂුවකගේ ස්වභාවය සූත්‍ර පිටකයේ අන්තර්ගත වී තිබෙන බවයි.

සූත්‍ර පිටකයේ අන්තර්ගත විනය පිටකාගත සංකල්ප එම පිටකයේ කුමන තැන්වල අන්තර්ගත වී ඇද්ද යන්න විමර්ශනය කිරීම වැදගත් වෙයි. එසේ කරුණු අන්තර්ගත සූත්‍රයක් ලෙස සුත්ත නිපාතයේ තුවටක සූත්‍රය පෙන්වාදිය හැකිය.

එහි දැක්වෙන ආකාරයට ධර්ම කරුණු හතකින් යුක්ත භික්ෂුව විනයධර වෙයි. එම කරුණු හත නම්

1. ඇවත දනියි.
2. ඇවැත් නොවන දේ දනියි.
3. ස්වල්ප වූ ඇවැත් දනියි.
4. මහා ඇවැත් දනියි.

5. ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් සංවර වෙයි.

6. ආචාරයෙන් හා ගෝචරයෙන් යුක්ත වෙයි.

7. ස්වල්ප වරදෙහි බිය දකියි. වශයෙනි

මේ අනුව සූත්‍රපිටකයේ අන්තර්ගත වී ඇති විනය පිටකාගත ධර්ම කරුණු පැහැදිලි වෙයි.

මෙහිදී වැදගත්වන සූත්‍ර දේශනාවක් වන්නේ **මජ්ඣිම නිකායේ** කෝසම්බිය සූත්‍රයයි. එහි දැක්වෙන ආකාරයට භික්ෂු ජීවිතයේදී සද්ධිවිහාරිකයන් වහන්සේලා සමඟ වාසය කරන විට කළ යුතු කටයුතු බොහෝමයක් දක්වා ඇත.

''කිඤ්චාපි යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචනානි කිංකරණීයානි, තත්‍ථ උස්සුක්කං ආපන්නො හොති බ්වාස්ස තිබ්බාපෙක්ඛා හොති අධිසීල සික්ඛාය අධිචිත්ත සික්ඛාය අධිපඤ්ඤා සික්ඛාය **(මජ්ඣිම නිකාය I, 2006, 760).**

සමාන භික්ෂූන් වහන්සේලා සමඟ වාසය කළ යුත්තේ තමාගේ අධිසීල, අධිචිත්ත, අධිපඤ්ඤා යන ලක්ෂණ ලිහිල් නොවන ආකාරයට බව මෙහි දැක්වෙයි.

**අංගුත්තර නිකායේ** අත්තහිත පරහිත සූත්‍රයේදී භික්ෂුවක් ක්‍රියා කළ යුතු ආකාරය පෙන්වා දෙයි. සංඝයාගේ හිතසුව පිණිස එසේ ක්‍රියා කළ යුතු බව දක්වා ඇත. විනයවාදිව ක්‍රියා කළ යුතු ආකාර පහක් එහි දක්වා තිබේ.

1. සම්බුද්ධ සාසනයේ භික්ෂුව තමාත් ශීල සම්පන්න වෙයි. අන් අයත් ශිලයෙහි පිහිටුවයි.
2. තමාත් සමාධි සම්පන්න වී අන් අයත් සමාධියෙහි පිහිටුවයි.
3. තමා ප්‍රඥාසම්පන්න වී අන් අය ප්‍රඥා සම්පන්න කරවයි.
4. තමා විමුක්තිය ලබා අන් අය විමුක්තිය වෙත යොමු කරවයි.
5. තමා විමුක්ති ඥාන දර්ශනය ලැබ අන් අයද එය වෙත යොමු කරවයි.

''අත්තනා ච සීලසම්පන්නො හොති පරඤ්ච සීල සම්පදාය සමාදපෙති. අත්තනාච සමාධි සම්පන්නො හොති පරඤ්ච සමාධි සම්පදාය සමාදපෙති අත්තනාච පඤ්ඤාසම්පන්නො හොති පරඤ්ච පඤ්ඤාසම්පදාය සමාදපෙති අත්තනාච විමුක්ති සම්පන්නො හොති. අත්තනාච විමුක්ත ඤාණදස්සන සම්පන්නො හොති පරඤ්ච විමුක්ති ඤාණ දස්සන සම්පන්නො හොති පරඤ්ච විමුක්ති ඤාණ දස්සන සම්පන්නො සම්පදාය සමාදපෙති **(අංගුත්තර නිකාය III, 2006, 41).**

මෙම සංකල්පය ද විනය ශික්ෂා තරම්ම භික්ෂු සංවරය සඳහා උපකාර වන කරුණු ලෙස පෙන්වාදිය හැකිය.

**අංගුත්තර නිකායේ** අපත්ති භය සූත්‍රය ද විනය කරුණු අන්තර්ගත දේශනාවකි. එහි දැක්වෙන ආකාරයට භික්ෂුව පරාජික ආපත්තිවලට බිය විය යුතු ආකාරය උපමාවක් මගින් පෙන්නුම් කර ඇත. මං පහරණ සොරෙකුට රජු විසින් මරණ දණ්ඩනය නියම කළ විට නගරය පුරා ඔහු මරණයට පත් කිරීම සඳහා ගෙන යන ස්ථානය දක්වා රැගෙන යන විට ඔහු දැක නගරවාසීන් බිය උපදවා ගන්නේ යම්සේද එසේම භික්ෂු භික්ෂුණීන් විසින් සතර පාරාජිකාවන් කෙරෙහි බිය උපදවාගත යුතු බව දක්වා ඇත.

''යස්ස තස්මිං වා භික්ඛුස්ස වා භික්ඛුණියා වා එවං තබ්බා භයසඤ්ඤා පච්චු පට්ඨිතා හොති පාරාජිකෙයාප ධම්මෙසු තස්සෙතං පාටිකංඛං අනාපන්නො වා පාරාජික ධම්මං න ආපජ්ජිස්සති ආපන්නො වා පාරාජිකං ධම්මං යථා ධම්මං පටිකරිස්සති **(අංගුත්තර නිකාය I, 2006, 24).**

මෙමගින් පැහැදිලි වන්නේ භික්ෂුවක් හෝ භික්ෂුණියක සියලු ආපත්ති කර්මයන්හි නිර්භයව සිහිය ඇතිව කිසිදු ආපත්තියකට නොපැමිණෙන්නෙමියි කල්පනා කළ යුතුය.

සූත්‍ර පිටකය තුළ විනය පිටකයේ මූලබීජ අන්තර්ගත වී ඇති බවට දැක්විය හැකි ප්‍රධාන සාධකයක් වන්නේ **මජ්ඣිම නිකායේ** භද්දාලි සූත්‍රයයි. මෙහිදී භද්දාලි භික්ෂුවට බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ ''සංඝ සමාජය සංකීර්ණ වන විට ආසවට්ඨානීය ධර්ම බහුල වන බවත් එවිට සාසනය පිරිහෙන බවත් එබැවින් ධර්මයෙහි

උන්නතිය වෙනුවෙන් නීති රීති අවශ්‍ය බවත් භද්දාලි භික්ෂුවට බුදුරජාණන් වහන්සේ දේශනා කළහ **(මජ්ඣිම නිකාය I, 2006, 175).**

එහිදී අවධාරණය කර ඇත්තේ ආසවට්ඨානීය ධර්ම පහළ වන තෙක් විනය නීති පැනවීම නොකරන බවත් ආසවට්ඨානීය ධර්ම ශාසනයේ බහුල වූ විට විනය නීති පනවන බවත් අවධාරණය කොට ඇත. එහෙත් විනය නීති සූත්‍ර පිටකය තුළම ඇතුළත්වන බවක් එමගින් ගම්‍යමාන වෙයි. එසේම ආසවට්ඨානීය ධර්ම පහළ වන්නට ප්‍රථම විනය ශික්ෂාපද පැනවීම සිදු කළේ නම් මීට වඩා යහපත් නොවේද යන්න පැන නගින ගැටලුවකි. එහෙත් බුදුන් වහන්සේ සෑම අවස්ථාවකදීම අවධාරණය කරන ලද්දේ ස්වයං ශික්ෂණයයි. තමාම තමාට දීපයක් කොට වාසය කරන්න යන්න උන්වහන්සේගේ අවවාදයයි. නීති පනවා සංඝ සාසනයේ ආධිපත්‍ය තමන් සතු කර ගැනීමේ කිසිඳු අවශ්‍යතාවයක් බුදුන් වහන්සේට නොවූ බව උන්වහන්සේ අවස්ථා කිහිපයකදීම දේශනා කර ඇත.

මෙහිදී තවත් අවධානය යොමු කළ යුතු කරුණක් වන්නේ ලෝක වජ්ජ හා පඤ්ඤත්ති වජ්ජ යනුවෙන් වරදෙහි ස්වභාවයන් දෙකක් පැවතීමයි. ලෝක වජ්ජ යනු ලෝකයෙහි වැරදි යැයි සම්මත කරගත් වැරදි වේ. ඒවා සිදු කිරීමෙන් දඬුවම් විඳීමට පවා සිදු වේ. එහෙත් පඤ්ඤත්ති වජ්ජ යනු නිර්වාණගාමී මාර්ගයේ ගමන් කරන විට ඊට අනදාළ දේ නොකරන ලෙස කරනු ලබන පැනවීමයි. එබැවින් ආසවට්ඨානීය ධර්ම පහළ වන තුරු විනය ශික්ෂාපද නොපැනවීම අරුම සහගත කරුණක් නොවේ.

ශාසනයේ විනය ශික්ෂා පැනවිය යුත්තේ කුමන කාලයේද සහ එහි අවශ්‍යතාව බුදුරජාණන් වහන්සේ අවබෝධ කරගෙන සිටි බව **පාරාජික පාලියේ** එන පහත සංවාදයෙන් පැහැදිලි වේ. ''එතස්ස භගවා කාලො යං භගවා සාවකානං සික්ඛාපදං පඤ්ඤපෙය්‍ය උද්දිසෙය්‍ය පාතිමෝක්ඛං ආගමෙහි ත්‍වං සාරිපුත්ත තථාගතොව තත්‍ථ කාලංජානිස්සති. න තාව සාරිපුත්ත සත්ථා සාවකානං චෙව සික්ඛාපදං පඤ්ඤාපෙමි. න උද්දිස්සති පාතිමෝක්ඛං යාවනං ඉධෙකච්චා න ඉධෙකම්මා ආසවට්ඨානියා ධම්මා සංඝෙ පාතු භවන්ති අථ සත්‍ථා සාවකානං සික්ඛාපදං පඤ්ඤාපෙති. උද්දිසති

පාතිමෝක්ඛං භඤ්ඤේච ආසවට්ඨානියානං ධම්මානං පටිඝාතාය'' **(පරාජිකා පාලි, 2006, 22).**

මෙහිදී විනය නීති පනවන්නට සුදුසු කාලය නොවේ. ශාසනයේ ආසවට්ඨානීය ධර්ම යම් කලෙක පහළ වෙත්ද එකල්හි ශික්‍ෂා පද හා ප්‍රාතිමෝක්‍ෂය අවශ්‍ය වන බව බුද්ධ වචනයෙහි සඳහන් වේ. ඒ අනුව පැහැදිලි වන්නේ ස්වයං ශික්‍ෂණයෙන් හික්මීම සෑම අවස්ථාවකම බුදුන් වහන්සේ අගය කර තිබෙන බවයි. අර්බුද රහිත අවස්ථාවක විනය ශික්‍ෂාපද පැනවීම යෝග්‍ය නොවන බව බුදුන් වහන්සේගේ අදහස විය. සංඝ සාසනයට ඇතුළුවන පිරිස අධික වී ක්‍රම ක්‍රමයෙන් සංකීර්ණවන විට විනය ශික්‍ෂා පනවන ලද බව මේ අනුව අවබෝධකරගත හැකිය. එතෙක් සූත්‍ර පිටකයේ විවිධ සූත්‍ර දේශනා මගින් විනය ශික්‍ෂාවන් දේශනා කර තිබෙන ආකාරය මේ අනුව අවබෝධකරගත හැකිය.

ශික්‍ෂාපද පැනවීමේදී බුදුරදුන් දැක්වූ සහනශීලි පිළිවෙත හෙළිකරන සංසිද්ධියක් **අංගුත්තර නිකායේ** තික නිපාතයේ සමණ වග්ගයේ වේසාලි නිදාන කතාවෙහි දක්නට ලැබෙයි. ''එක් කලෙක භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විශාලා මහනුවර කූටාගාර ශාලාවෙහි වැඩ සිටිති. එකල එක්තරා වජ්ජි රාජ්‍යයට අයත් වජ්ජි පරපුරෙන් පැවිදි වූ භික්‍ෂුවක් බුදුන් වහන්සේට මෙසේ සැලකළහ.

ස්වාමීනි සියයකට අධික ශික්‍ෂාපද ප්‍රමාණයක හික්මෙන්නට මට නොහැකි බවයි. එවිට බුදුන් වහන්සේ විමසන්නේ මහණ නුඹට අධිශීල අධිචිත්ත හා අධි පඤ්ඤා වඩන්නට හැකිදැයි යන්නයි. එය හැකියැයි පැවසූ විට එසේ නම් එය වඩන ලෙසත් එවිට රාග ද්වේශ මෝහ ප්‍රහාණය වන බවත් දක්වා ඇත **(අංගුත්තර නිකාය I, 2006, 409).**

මෙම ප්‍රවෘත්තියෙන් ද ශික්‍ෂාපද පනවා භික්‍ෂූන්ට අනවශ්‍ය මානසික පීඩනයක් ලබා දෙන්නට බුදුන් වහන්සේ ක්‍රියා නොකළ බව පැහැදිලි වෙයි. එහෙත් ස්වයං ශික්‍ෂණයෙන් යුක්තවන භික්‍ෂූන් අනුගමනය කළ යුතු ශික්‍ෂාපදයන්ද දක්වා ඇත. ධර්මය පදනම් කරගෙන මුල්කාලීන භික්‍ෂූන් වහන්සේලා හික්මුණු බවට සාධක සැපයෙන තවත් සූත්‍ර දේශනාවක් වන්නේ **සුත්ත නිපාතයේ** තුවටක සූත්‍රයයි. එහි දැක්වෙන ආකාරයට

''එතඤ්ච ධම්මපඤ්ඤාය

විචිනං භික්ඛු හද්‍රාසතොසික්ඛෙ

සන්තීති නිබ්බුතිං ඤත්වා

සාසනෙ ගොතමස්ස නප්පමජ්ජෙය්‍ය'' **(ඛුද්දක නිකාය II, 2006, 294).**

භික්ෂුව ධර්මය දැනගෙන අනිත්‍ය ලක්ෂණාදිය විමසමින් හැමකල්හිම ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මෙන්නේය. පමා නොවන්නේය.

මේ අනුව විනය ශික්ෂා පද සූත්‍ර පිටකයේ විවිධ සූත්‍රවල අන්තර්ගත වී තිබෙන ආකාරය අවබෝධකරගත හැකිය. මෙහිදී අවධානය යොමු කළ යුතු තවත් වැදගත් අදහසක් වන්නේ විනය පිටකය බිහිවීමට ප්‍රථම සූත්‍ර පිටකය තුළ විනය කාරණා ඇතුළත් වී තිබූ බවයි. ඒ අනුව ධර්මය විනයට ප්‍රථමයෙන් ඇති වූ බව නිසැකවම පැවසිය හැකිය.

මුල්කාලීන සූත්‍ර දේශනාවලදී සීලයෙහි ආනිසංස ඉතා උසස් ආකාරයෙන් දක්වා ඇත. ඛුද්දකනිකාය **ධම්මපද පාලියේ** සීලයෙහි ආනිසංස ඉතා උසස් ලෙස දක්වා ඇත.

''චන්‍දනං තගරංවාපි උප්පලං අථ වස්සිකී එතෙසං ගාන්ධ ජාතානං සීලගන්ධො අනුත්තරො'' **(ඛුද්දක නිකාය I, 2006, 38).**

සඳුන් තුවරලා මානෙල් දෑ සමන් ආදි සෑම සුවඳකට ම වඩා අනුත්තර වූ බුද්ධාදි උතුමන් වහන්සේලාගේ සීල සුවඳ උතුම්ය.

''අප්පමත්තො අයං ගන්‍ධො - යායං තගරචන්‍දනී යොච සීලවතං ගන්‍ධො වාති දෙවෙසු උත්තමො'' **(එම)**

සඳුන් ආදි යම් සුවඳක් වේද එය ඉතාම අල්ප වූ සුවඳකි. එහෙත් බුද්ධාදි උතුමන්ගේ සීලය දෙව් මිනිසුන් අතර පවා පැතිරෙන්නකි.

ඉහත සඳහන් තොරතුරු දෙස අවධානය යොමු කිරීමෙන් පැහැදිලි වන්නේ විනය ශික්ෂාපද පනවන්නට පෙර සූත්‍ර ධර්ම තුළ

විනය ශික්ෂා පද දේශනා කර ඇති බවයි. ඒ අනුව සූත්‍ර පිටකයෙහි විනය පිටකයේ මූලබීජ බොහෝ සෙයින් අන්තර්ගත වී තිබෙන බවත් එම ශික්ෂාපදයන් පශ්චාත් කාලීනව විනය පිටකයට එකතු වූ බවත් නිගමනය කළ හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


01. **අංගුත්තර නිකාය II**, ආපත්ති වග්ගය, ආපත්තිභය සූත්‍රය, 2006, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල. 2006. ත්‍රි. බු. ජ. මු.

02. **ඉතිවුත්තක පාළි අට්ඨකතා** (සිංහල පරිවර්තනය), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල. 2006.

03. **පටිසම්භිදා මග්ග අට්ඨකතාව**, 2006, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල.

04. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, 1998, **පාලි සිංහල අකාරාදිය**, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල.

05. **පරාජිකා පාලි**, 2006, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල.

06. **ඛුද්දක නිකාය** 1, ධම්මපද පාලි, 2006, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල.

07. **මජ්ඣිම නිකාය**, භද්දලි සූත්‍රය, 2006, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල.

04. Davids Rhys, **T. W. Pali English Dictionary** William Stade India. 1999. P. 623 - 451 පිටුව.